ඒකාබද්ධ සේවා චක්‍රලේඛ : 05/2019

මගේ අංකය:PA/CS/POLICY/ව්‍යවස්ථා සංශෝධන(වෙළුම II)
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.10.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තනතුරු නාමය වෙනස් කිරීම</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක :1840/34 හා 2013.12.11 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, අංක 2032/26 දරණ 2017.08.16 දිනැති හා අංක 2052/26 දරණ 2018.01.04 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර මගින් සංශෝධනය කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ තනතුරු නාමය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග මත 2019.09.09 දින පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක :2140/4 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කොට ඇති අතර එමගින් "රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය" යන්න වෙනුවට "කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහය"ලෙස ආදේශ කොට ඇත.

02. ඒ අනුව 2019.09.09 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සියළුම නිලධාරීන් "කළමනාකරණ සේවා නිලධාරී" සේවය වෙත අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් සේ සලකන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

කේ.වී.පී.එම්.ජේ. ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්